<table>
<tr><td colspan="3">

**<u>මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ</u>**<br>**<u>නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ තනතුරට පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ</u>**<br>**<u>ලකුණු නිර්ණායක</u>**

</td></tr>
<tr><td></td><td>ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර</td><td>උපරිම ලකුණු</td></tr>
<tr><td>01. ජ්‍යෙෂ්ඨත්වය<br>ලකුණු 40</td><td>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය සේවා කාලය ඉක්මවා සම්පූර්ණ කර ඇති මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>ලකුණු<br>40</td></tr>
<tr><td rowspan="7">02. කුසලතාවය<br>ලකුණු 60</td><td>02.1. <u>කාර්යය සාධන අගැයුම්</u><br>අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහ(05)ක කාල සීමාව තුළ වාර්ෂික කාර්යය සාධන අගැයීම්වලින් ලබා ගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.
<table>
<tr><td>02.1.1. විශිෂ්ටයි</td><td>ලකුණු 03</td></tr>
<tr><td>02.1.2. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ</td><td>ලකුණු 02</td></tr>
<tr><td>02.1.3. සතුටුදායකයි</td><td>ලකුණු 01</td></tr>
</table></td><td>ලකුණු<br>15</td></tr>
<tr><td>02.2. <u>තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම්</u><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්,
<table>
<tr><td>02.2.1. පශ්චාත් උපාධිය, සමාන හෝ ඉහළ සුදුසුකම්</td><td>ලකුණු 05</td></tr>
<tr><td>02.2.2. පශ්චාත් ඩිප්ලෝමා</td><td>ලකුණු 03</td></tr>
</table>
(මෙහිදී බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස සැළකූ උපාධිය. කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම හා ශ්‍රේණි උසස් කිරීම් සඳහා සළකා බැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ පශ්චාත් උපාධි හැර, අනෙකුත් සුදුසුකම් අතුරින්, ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)</td><td>ලකුණු<br>05</td></tr>
<tr><td>02.3. <u>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද</u><br>අදාළ ක්ෂේත්‍රයේ II ශ්‍රේණියේ තනතුරක රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ වසර 03ක හෝ ඊට වඩා වැඩි කාලයක් ස්ථිර පදනමින්/වැඩ බැලීම/රාජකාරී ඉටු කිරීම සඳහා පත් කිරීම<br>- වසර 03ට - ලකුණු 06<br>- වැඩි වන වසරකට ලකුණු 02 බැගින්<br>(අදාළ පත්වීම් බලධරයා විසින් නිකුත් කරන ලද ලේඛන ඉදිරිපත් කළ යුතු වන අතර එම ලේඛන වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)</td><td>ලකුණු<br>10</td></tr>
<tr><td>02.4. <u>මූල්‍ය කළමනාකරණය, පරිපාලන සහ සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධය</u>
<table>
<tr><td>02.4.1. මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු පිළිබඳ දැනුම</td><td>ලකුණු 10</td><td rowspan="2">ඇමුණුම I</td></tr>
<tr><td>02.4.2. සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධය</td><td>ලකුණු 05</td></tr>
</table>
(ඉහත අවස්ථාවන් සඳහා අදාළ වන ලේඛන ඉදිරිපත් කළ යුතු වන අතර එම ලේඛන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)</td><td>ලකුණු<br>15</td></tr>
<tr><td>02.5. <u>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ වන පරිදි නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය</u><br>ප්‍රකාශයට පත්කර ඇති වෘත්තීය මට්ටමේ ප්‍රකාශන, විෂය ක්ෂේත්‍ර හා ඉන් ඔබ්බට සිදුකර ඇති සුවිශේෂී වූ නිර්මාණශීලී වැඩසටහන්, පුවත්පත්, සඟරා වලට සපයා ඇති ලිපි, සංවර්ධන ව්‍යාපෘති හා නව තාක්ෂණික සොයා ගැනීම් සම්බන්ධ තොරතුරු සනාථ කෙරෙන ලිපි ලේඛන වාර්තා ආදිය<br>(උපාධිය හෝ පශ්චාත් උපාධිය සඳහා සිදු කරන ලද පර්යේෂණ හැර)</td><td>ලකුණු<br>05</td></tr>
<tr><td>02.6. <u>වෙනත් සුදුසුකම්</u>
<table>
<tr><td>02.6.1. ජාතික/ පළාත් මට්ටමේ ජයග්‍රහණ</td><td>ලකුණු 1.5 බැගින් උපරිම අවස්ථා 02</td></tr>
<tr><td>02.6.2. ප්‍රශංසා ලිපි (පොදු 230 'බී' ආකෘතිය</td><td>ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 02</td></tr>
</table>
(ඉහත අවස්ථාවන්ට අදාළ ලේඛන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)</td><td>ලකුණු<br>05</td></tr>
<tr><td>02.7. <u>සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද නිපුණතාවය</u>
<table>
<tr><td>නායකත්වය හා පෞරුෂය</td><td>ලකුණු 02</td></tr>
<tr><td>සන්නිවේදන හැකියාව</td><td>ලකුණු 02</td></tr>
<tr><td>ආකල්ප</td><td>ලකුණු 01</td></tr>
</table></td><td>ලකුණු<br>05</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>100</td></tr>
</table>

- ඇමුණුම I –

| නිර්ණායකය | ලකුණු ලබා දිය හැකි වලංගු ලිපි ලේඛන |
|---|---|
| 2.4.1. මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු පිළිබඳ දැනුම | <u>මූල්‍ය කළමනාකරණය - ලකුණු 05</u><br><br>1. පුහුණුවලට සහභාගී වීම් - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 03<br>2. තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01<br>3. ප්‍රසම්පාදන කමිටු සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01<br><u>පරිපාලන කටයුතු - ලකුණු 05</u><br><br>1. පුහුණුවලට සහභාගී වීම් - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 03<br>2. ස්ථාන මාරු මණ්ඩල සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01<br>3. මූලික විමර්ශන මණ්ඩල සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01 |
| 2.4.2. සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධය | <u>සංවර්ධන කටයුතු - ලකුණු 05</u><br><br>1. පුහුණුවලට සහභාගී වීම් - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 03<br>2. සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කමිටු සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01<br>3. විෂයානුබද්ධ කමිටු සාමාජිකත්වය - එක් අවස්ථාවකට ලකුණු 01 බැගින් උපරිම අවස්ථා 01 |